අයදුම්පත් අංකය | | | | | / | | / | | | |

**<u>රටම එළියයි - අඳුර දුරලයි</u>**

**<u>ජාතික විදුලි සත්කාරය</u>**

අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................................................

විදුලිය අයදුම් කරනු ලබන ස්ථානයේ ලිපිනය : ..........................................................................................

අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

ග්‍රාම නිලධාරී වසමේ නම : ..........................................................................................

විදුලිය ලබා ගැනීමට යෝජිත නිවස තතැඳුම් කර තිබේ ද ? ඔව් / නැත

අඩු ආදායම්ලාභියෙකු වන මා හට ඉහත සඳහන් මාගේ නිවසට විදුලි සැපයුම ලබා ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කොට ඇති රටම එළියයි - අඳුර දුරලයි ජාතික විදුලි සත්කාරය සහන ණය යෝජනා ක්‍රමය යටතේ කටයුතු කර විදුලි සැපයුම ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

දිනය : .................................

...............................................

අයදුම්කරුගේ අත්සන

ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු,

මෙම ඉල්ලුම් පත්‍රයේ නම සඳහන් අයදුම්කරු මාගේ ග්‍රාම නිලධාරී වසම තුල පදිංචි කරුවෙකු බව සහතික කරමි.

.................................................. ..................................................

ග්‍රාම නිලධාරීගේ අත්සන

නම :..............................................

වසමේ නම :.................................

දිනය :..........................................

දිවිනැගුම සංවර්ධන නිලධාරීගේ අත්සන

නම :..............................................

වසමේ නම :.................................

දිනය :..........................................

විදුලි අධිකාරීගේ නිර්දේශය (නිවසේ ස්වභාවය ලකුණු කරන්න.)

1. විදුලි අයදුම්කර ඇති ඉහත නිවසේ වර්ගඵලය

| | | |
|---|---|---|
| 1 | ව.අ. 500 ට අඩු | |
| 2 | ව.අ. 500 – 1000 | |
| 3 | ව.අ. 1000 – 1500 | |
| 4 | ව.අ. 1500 ට වැඩි | |

2. ඉහත නිවසේ කාමර ගණන (මුළුතැන්ගෙය සහ සාලය අතහැර)

| | | |
|---|---|---|
| 1 | එකයි | |
| 2 | දෙකයි | |
| 3 | තුන සහ ඊට වැඩි | |

3. නිවස තතැඳුම් කර තිබේ ද ?

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

4. නිවසේ වහලය

| | | |
|---|---|---|
| 1 | උළු සෙවිලි | |
| 2 | ඇස්බැස්ටස් සෙවිලි | |
| 3 | ටකරන් සෙවිලි | |

5. ඉහත නිවසට විදුලිය ලබා දීමට අවශ්‍ය විදුලි රැහැන් මාර්ගයේ දිග (සේවා සැපයුම් චක්‍රලේඛයට අනුව) මීටර්............
ඉහත අයදුම්කරුගේ නිවසට විදුලිය ලබාදීමට නිවසේ තතැඳුම් කිරීමට සුදුසු තත්ත්වයක පවතින අතර, සේවාව ලබාදීමට පිළියෙල කරන ලද ඇස්තමේන්තුව අනුමැතිය සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

විදුලි අධිකාරී ( ..........................................පා.සේ.ම )

පළාත් ආදායම් ගණකාධිකාරි,

..................................................පා.සේ.ම යේ විදුලි අධිකාරී විසින් නිර්දේශ කර ඇති ඉහත නිවස වෙත විදුලිය ලබාදීම සඳහා රු. ......................................... ක ණය මුදලක් ගෙවීම අනුමත කරමි.

දිනය:.....................................

ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු (.......................................)

PE/DEV/01/80/2015 2015.11.

සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය

සභාපති
ලංකා විදුලි පුද්. සමාගම

**<u>රටම එළියයි - අඳුර දුරලයි</u>**

**<u>ජාතික විදුලි සත්කාරය</u>**

**<u>විදුලි ප්‍රවේශය පැවතියද මෙතෙක් විදුලිය ලබා ගැනීමට නොහැකි වී ඇති ජනතාවට සහනදායී පදනම මත මාස තුනක් තුළ විදුලිය ලබා දීමේ "ජාතික විදුලි සත්කාරය" වැඩ සටහන පිළිබඳ විධිවිධාන</u>**

1.1 පසු ගිය කාලය තුල රජය විසින් විදුලිබල ක්ෂේත්‍රයේ විශාල ආයෝජනයන් සිදු කර ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය විදුලියන ව්‍යාපෘති යටතේ කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල 100% විදුලියන ආවරණයක් ඇති කර ඇත. එමෙන්ම අනෙකුත් සෑම දිස්ත්‍රික්කයකම පාහේ 90%කට වැඩි විදුලි ආවරණ ප්‍රතිශතයක් ඇති කර ඇත. 2016 වර්ෂය වන විට 100%ක විදුලියන ආවරණයක් රට තුල ඇති කිරීම රජයේ ඉලක්කයයි. කෙසේ නමුත් 100%ක විදුලි ආවරණයක් ඇති වීමෙන් පසුවද එම ආවරණිත ප්‍රදේශවල පදිංචි ජනතාව සියළු දෙනාම විදුලි සේවාව ලබා ගෙන නොමැත.

1.2 මෙම අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහය ඇතිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදු කරන ලද සමීක්ෂණය අනුව පෙනී යන්නේ තවමත් නිවාස ඒකක 200,000ක් පමණ විදුලි සේවාව ලබා ගෙන නොමැති බවයි. මෙයට ප්‍රධාන හේතුව ලෙස හඳුනාගෙන ඇත්තේ නිවස අසල විදුලි ප්‍රවේශ රැහැන් තිබුනද නිවාස තතැළුම් කිරීම සහ විදුලි සේවා සම්බන්ධතාව ලබා ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවිය යුතු මූලික පිරිවැය දරා ගැනීමට අදාළ පදිංචිකරුවන්ට ආර්ථික හැකියාවක් නොමැති වීම බවයි. මෙවැනි නිවාස ඒකක වෙත විදුලි සේවාව ලබා දීම සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර ක්‍රමය හා සමෘද්ධි සංවර්ධන බැංකුවේ මැදිහත් වීම සහිත ණය ආධාර ක්‍රමය ක්‍රියාත්මක වුවද තවමත් විදුලි සේවා සම්බන්ධතාව ලබා නොගත් නිවාස ඒකක 175,000ක් පමණ ඇති බව පෙනී යයි. මෙය කිසිසේත් සෑහීමකට පත් විය නොහැකි තත්වයකි.

1.3 ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවන තත්වය ඉහල දැමීම සඳහා විදුලිය මූලික අත්‍යවශ්‍ය සාධකයකි. රජය විශාල මූල්‍ය ආයෝජනයක් සිදු කර ඇත්තේ ජනතාවගේ මෙම මූලික අවශ්‍යතාව සපුරාලීම සඳහා වන අතර රජයේ මෙම ආයෝජනවල උපරිම ප්‍රයෝජන ගැනීමට නම් ජනතාවට උපරිම ලෙස විදුලි සේවාව ලබා දිය යුතුය. මේ නිසා අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති

අමාත්‍යතුමා සහ ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා විසින්, කඩිනම් වැඩසටහනක් ලෙස, විදුලි ආවරණිත ප්‍රදේශවල පදිංචිව සිටින සියළු ජනතාව වෙත විදුලි සේවාව ලබා දීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට උපදෙස් දී ඇති අතර 2016 ජනවාරි මස 31 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකාවේ විදුලි ආවරණිත ප්‍රදේශවල සිටින සියළු ජනතාව වෙත විදුලි සේවාව ලබා දී ඇති බවට වන ස්ථිර ප්‍රකාශය ලබා දීමට නියමිතය.

1.4 මේ වන විට ක්‍රියාත්මක වන ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර ව්‍යාපෘතිය හා සමෘද්ධි සංවර්ධන බැංකුවේ මැදිහත් වීම සහිත ණය ආධාර ක්‍රමය තව දුරටත් ව්‍යාප්ත කර, නව සහන ණය ක්‍රමයක් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ නිසා මූල්‍ය දුෂ්කරතාවයන් හේතුවෙන්, විදුලි ප්‍රවේශය පැවතියද විදුලි සේවා සම්බන්ධතාව ලබා ගෙන නොමැති සියළු පවුල් ඒකක වෙත පහත සඳහන් සහන ණය ක්‍රමය හඳුන්වා දෙනු ලැබේ.

1.5 මේ වන විට හඳුනාගෙන ඇති හා ඉදිරියේදී හඳුනා ගනු ලබන, විදුලි සේවාව ලබාගෙන නොමැති සියළු නිවාස ඒකක වෙත එම නිවාස තතැඳුම් කිරීමට හා විදුලි සේවා සම්බන්ධතාව ලබා ගැනීමට රු. 40,000/-ක උපරිමයකට යටත්ව ණය මුදලක් ලබා දෙනු ඇත. එම ණය මුදල සමාන මාසික වාරික 72කින් මාසික විදුලි පරිභෝජන ගාස්තුව සමග ලංකා විදුලිබල මණ්ඩලය / ලංකා විදුලි පුද්. සමාගම විසින් අය කර ගත යුතු වේ. එහි දී ලබා දෙන ණය මුදල මත 7%ක වාර්ෂික පොලී අනුපාතිකයක් අනුව ගණනය කරන ලද සමාන වාරික වලින් අය කර ගත යුතු වේ. මෙහිදී මෙම සේවාව ලබාදීම සඳහා වන ණය මුදලින් රු. 17,500/-ක් නිවාස තතැඳුම් කිරීම සඳහා සහ ඉතිරි මුදල විදුලි සේවා සම්බන්ධතාව ලබා දීමේ මූලික පිරිවැය ලෙසත්, විදුලි ඉල්ලුම්කරුගේ අවශ්‍යතාව හා ඇස්තමේන්තුව අනුව උපරිම වශයෙන් උපයෝගී කර ගත යුතුය.

1.6 මෙම සහන ණය සේවාව ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය මේ සමග අමුණා ඇත. එම අයදුම්පත්‍රය මේ වන විට හඳුනාගෙන ඇති සියළු පවුල් ඒකක වෙත ලබා දී දින 14ක කාලයක් තුල සම්පූර්ණ කරන ලද අයදුම්පත ප්‍රාදේශීය විදුලි අධිකාරී වෙත ලබා ගත යුතුය. මේ සඳහා සියළු දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් හා දිවිනැගුම සංවර්ධන නිලධාරීන් ආදී ප්‍රාදේශීය මට්ටමේ සියළුම රජයේ නිලධාරීන් සහභාගි කර ගත යුතුය.

1.7 එසේ ලැබෙන අයදුම්පත්වලට අදාළ නිවාස ඒකක තතැඳුම් කිරීම ලංකා විදුලිබල මණ්ඩලය මගින් පවත්වා ගෙන යනු ලබන සුදුසුකම් සහිත විදුලි කාර්මික ලේඛනයේ ලියාපදිංචි වී ඇති විදුලි කාර්මිකයකු ලවා දින 07ක් තුල සිදු කර ගත යුතුය. මෙම නිවාස තතැඳුම් කිරීමේ කාර්යය; ගෘහස්ථ විදුලි පරිපථය, ප්‍රධාන ස්විචය, ශේෂ ධාරා පරිපථ බිඳිනය (RCCB), සිඟිති ධාරා පරිපථ බිඳිනය (MCB), විදුලි පහන් 04ක්, කෙවෙනි පිටුමන් 01ක්, L යකඩය හා බිම්ගැන්වුම යන මූලික උපාංගවලින් සමන්විත විය යුතුය. (අදාළ නිවාස තතැඳුම් කිරීමේ භාණ්ඩ වියදම හා කාර්මික කුලිය ද ඇතුළුව රු. 17,500/-ක උපරිම සීමාවට යටත්ව, අදාළ කාර්මිකයා කාර්යය නිම කර වාර්තා කිරීමෙන් පසුව, නිසි ප්‍රමිතියට අනුකූල වන සේ සිදු කර ඇති බවට ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි අධිකාරීවරයා / ලංකා විදුලි පුද්. සමාගමේ ශාඛා කළමනාකරු සෑහීමකට පත් වීමෙන් පසුව ප්‍රතිපූරණය කළ යුතු වේ.)

1.8 විදුලි තතැඳුම් කිරීම අවසන් වූ පසු, විදුලි සේවා සම්බන්ධතාව ලබා දීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු / ලංකා විදුලි පුද්. සමාගමේ ශාඛා කළමනාකරු විසින් දින 02ක් තුල ඇස්තමේන්තු සකස් කර අනුමත කර අදාළ ණය මුදල නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. එම කටයුතු අවසන් වීමෙන් පසු දින 02ක් තුල විදුලි සේවා සම්බන්ධතාව ලබා දීමට කටයුතු කළ යුතුය.

1.9 එක් එක් මාසවල විදුලි සේවා සම්බන්ධතා ලබා දීමේ ප්‍රගතිය, අනිවාර්යයෙන්ම ඊළඟ මාසයේ මුල් සතිය තුල මෙම අමාත්‍යාංශය වෙත හා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. (අදාළ ආකෘති පත්‍රය මේ සමග අමුණා ඇත.)

මෙම වැඩ සටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ හා ලංකා විදුලි පුද්. සමාගමේ එක් එක් ශ්‍රේණිවල නිලධාරීන් හා සියළු කාර්ය මණ්ඩලය තම උපරිම කැපවීම හා දායකත්වය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

**ආචාර්ය බී.එම්.එස්. බටගොඩ**
**ලේකම්**
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

පිටපත්:-

1. ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා - කරු. දැ.ගැ.ස.
2. ගරු සමාජ සවිබල ගැන්වීම හා සුභසාධන අමාත්‍යතුමා - කරු. දැ.ගැ.ස.
3. ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා - කරු. දැ.ගැ.ස.
4. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කරු. අ.ක.ස.
5. ලේකම්, සමාජ සවිබල ගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය - කරු. අ.ක.ස.
6. සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය - කරු. අ.ක.ස.
7. සාමාන්‍යාධිකාරී, ලංකා විදුලි පුද්. සමාගම - කරු. අ.ක.ස.
8. අධ්‍යක්ෂ ජනරාල්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස.
9. අධ්‍යක්ෂ ජනරාල්, මහජන උපයෝගීතා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
10. අතිරේක සාමාන්‍යාධිකාරී (කලාප 01/02/03/04), ලංකා විදුලිබල මණ්ඩලය - කරු. අ.ක.ස.